පොද වැටෙන්නට ගත්තේ ය. අතු පතර වැසි දිය රැඳුණොත් ඉන් බේරීමට උයන්පල්ලාට වෑයම් කළ යුතු නොවී ය. උයන්පල්ලා චියැංචි ගස හා කතා කළේ ය.
"මට සීතලයි.....මාව තෙමන්න එපා..."
හේ මිමිණුවේය. චියැංචි ගසේ අතු හමා එන සුළඟ වළක්වන්නට සිය අතු පතර එහා මෙහා සෙලෙව්වේ උයන්පල්ලාගේ වදන් ඇසුනාක් මෙනි. උයන්පල්ලා ඇද සිටි කාකි පැහැති කමිසය හිස දක්වා පොරවා ගත්තේ ය. ඇද හැලෙන වැසි පොද දිහා ඔහේ බලාගෙන සිටියේ ය. වැසි පොද ක්‍රමයෙන් සිය උජාරුව වැඩි කරමින් තිබිණි. උයන්පල්ලාට හදිසියෙම පා හඬක් හා තදින් හුස්ම හෙලන හඬක් ඇසුණෝ ය.
වටපිට බැලූ ඔහු දුටුවේ චියැංචි ගසේ කඳට හේත්තු වී හති අරින එල්සිව ය.

"දුවලා..........දුවල ආවේ......වැස්සෙන් බේරෙන්න.........මාව හොඳටම තෙමුණා...."
ඇය හිසින් බේරෙන වැසි දිය මිරිකා ලමින් කීවා ය.
ඇගේ කොණ්ඩය වැසි දියෙන් පෙඟුණු නිසාදෝ ඈ කෙරෙන් දිස් වූයේ අමුතු ම සුන්දරත්වයකි.
"මං මෙතෙන්ට ආවේ වැස්ස වහින්න ඉස්සෙල්ලා.....ඒත් වහිනකොටත් ගහ පාමුල ම මට ඉන්න හිතුණා....." උයන්පල්ලා කීවේ ඇගේ ඇස් මග හරිමිනි.

හාත්පස අඳුර වෙළා ගෙන තිබුණි. වැස්ස ද නවතින පාටක් නැත. වැහි බිංදු වැටීමේ වේගය වැඩි වන බව උයන්පල්ලා දුටුවේ ය.

"දැන් නම් මාව තෙත බරියන් .........වෙලා...." එල්සි ඇගේ දිග සායේ කොණක් මිරිකා හරිමින් කීවා ය.
උයන්පල්ලා ඈ දෙස නොබලා සිටීමට තවදුරටත් උත්සාහ කළේය. දෙපා යටින් මතු වූ සීතලක් ක්‍රමයෙන් මුළු සිරුර ම වෙළා ගන්නා සේ ඔහුට දැනුණි. ඈතින් අකුණක් පිපිරුවේ ය. එල්සි බිය වී සිටියා ය. ඈ ඔහු වෙත ළං වූයේ බියෙන් හා සීතලෙන් ආකුල වූ දෑසිනි. වැසි දියෙන් තෙමී ගිය ළඳක් ඔහු ඉදිරියේ සිටිනු දැකීමට ද උයන්පල්ලා කැමති නොවූ සේ ය.
"අපි....ලේඩි කොටේජ් එක පැත්තට දුවමු ද....." උයන්පල්ලා ඇගෙන් ඇසීය.

"දැන්.....මුළු ඇඟම තෙමිලා ඉවරයි.... දුවලා වැඩක් නැහැ....."
එල්සිගේ ස්වරය වෙවුලී ය. ඔවුන් දෙදෙනා නොදැනුවත්ව මෙන් ම දැනුවත් ව එකිනෙකාට ළං වූහ. ඔහු මුලින් ම උත්සාහ ගත්තේ ඈ සීතලෙන් මුදවා ගැනීමට ය. සිය කාකි පැහැති කමිසය ගැලවූ උයන්පල්ලා ඉන් එල්සිගේ හිස වැසුවේ ය. ඈ උයන්පල්ලාගේ සිරුරට හේත්තු වූවා ය.

***ඈතින් අකුණක් පිපිරුවේ ය. එල්සි බිය වී සිටියා ය. ඈ ඔහු වෙත ළං වූයේ බියෙන් හා සීතලෙන් ආකුල වූ දෑසිනි.***

වැසි සමය නිමා වී තිබුණි. චියැංචි ගස පාමුල තෙත් ගතිය පහ වී නොගිය ද ප්‍රේමවන්තයන් යුවලක් එහි මුලක් ළඟ වාඩි වී සිටියහ. වැස්ස පැවතුණ දිනවල හමුවීමට නොහැකි වූ නිසාදෝ ඔවුන්ට කතා කරන්නට, හුවමාරු කර ගන්නට බොහෝ දෑ තිබුණි. පෙම්වතා සිය පෙම්වතිය දෙසට නැඹුරු වෙමින් ඇගේ කම්මුල සිප ගත්තේ ය. ඈ සිය හිස පස්සට කර මුහුණ ඉහළට එස වූයේ තවත් ආරාධනාවක ස්වරූපයෙනි. පෙම්වතා එය පිළිගත්තාක් සේ ඇගේ මුව වෙත ළං වූයේ ය. මේ සියල්ල උයන්පල්ලා බලා සිටියේ ය. ඔහු සිටියේ පෙම්වතුන්ට නොපෙනෙන පරිදි ගසකට මුවා වී ගෙන ය. වහා එදෙසට යා යුතු යැයි සිතා ඔහු සුපුරුදු ගමන ඇරඹී ය. පිටුපසින් "සර සර...." හඬක් ඇසුණෙන් පෙම්වත්හු පියවි ලොවට පැමිණියහ.

පිටුපස බලත් ම ඔවුන් දුටුවේ උයන්පල්ලාව ය. ඔවුන් දෙදෙනා අතර එක්වර ම ඉඩ පරාසයක් නිර්මාණය වූයේය. උයන්පල්ලා කිසිත් නොදෙඩී ය. යන්නට හැරුණෝ ය. ඔහුගේ මුහුණේ දිස් වූයේ අමුතු ම ස්වරූපයකි. ප්‍රේමවන්තයන් උනුත් මුහුණ බැලුවේ මවිතයෙනි. චියැංචි ගසේ එක් අත්තක කුඩා මල් පොහොට්ටුවක් නැගී තිබුණේ කාටත් හොරා ය.

## තල්, පොල් සහ මුතු පබා

13 පිටෙන්

ස්වදේශීය රසකාමියෙකු සිංහල සුරූපිනියන් මෙසේ විස්තර කර ඇත.

ඇගේ කෙස්කළඹ මොනර පිලක් සේ පිම්බී ඇත. එය හඳවල් දහයක් පුරා වැඩුණු තල් කොලයක් සේ දිගය. ඇහි බැම දේදුන්නක් සේ නැවී ඇත. ඇස්, කොට්ටන් ගෙඩියක් සේ දිගටි වන අතර සඳ නැති මැදියම් රැයක් මෙන් කළුය. නාසය උකුසු හොටක් මෙන් කුඩාය. පිරුණු දෙතොල් පබළු කොරල් මෙන් හෝ නා ගසක ලා දළු මෙන් රතු පැහැතිය. කුඩා මෙන්ම එකිනෙකට යා වී පිහිටි දත් සමන් පිච්ච පොහොට්ටු වැනිය. නැතහොත් බෙලි කටුවෙන් ගලවා ගත් මුතු මෙනි. ගෙල කෙසෙල් ගසක බොඩය මෙන් ඝනය, වටකුරුය. පපු පෙදෙස පුළුල්ය. පිරුණු පියයුරු තැඹිලි ගෙඩි මෙනි. දෑතින් මිට මොලවා ගත හැකි තරමට ඉඟ සිහින්ය. උකුළ රවුම් හැඩ ගනී. දෙපා සිහින්ය. යටි පතුල් පැතලිය. සියොළඟ මුදුය. සිනිඳුය. වටකුරුය. ඇට හෝ මාංශ පේශීන් හෝ පිටට නෙරා නැත. කැලල් නැති සම දීප්තිමත් දුඹුරු පැහැතිය.

මිනිසුන් වශයෙන් සිංහලයන් කරුණාවන්ත ය. ගරුසරු සහිතය. නොවැරදීම කෙනෙක් තවත් කෙනෙකුට විශේෂ සැලකීමක් දක්වයි. ඉහල පංතියේ අය අතර අහංකාර කමක් නැත. පහළ පංතියේ අය අතර අනුන්ගෙන් යැපීමක් හෝ ගැති කමක් නැත. කෙනෙක් සුහද ලෙස නිහතමානී වන විට අනෙක් තැනැත්තා ගෞරවාන්විතව එය ඉවසයි. ඔවුන් නිරන්තරව ප්‍රිය සමාගමට ලොල් වු අය නොවන නමුදු,අතිශය සමාජශීලීය. ඔපාදුප බිනීමෙහි දක්ෂයෝය. පිරිමි කාන්තාවන් කෙරෙහි පමණ ඉක්මවා ආචාරශීලී නොවෙති. ඇත්ත වශයෙන්ම නිවර්තන රටවල මිනිසුන් අතර ගැහැණුන් වෙත වඩාත් හෘදයංගමව හා හැඟීම්බරව ආචාර සම්පන්න වීමක් දක්නට නොලැබේ.

***සිංහලයුන් නිරන්තරව ප්‍රිය සමාගමට ලොල් වු අය නොවන නමුදු,අතිශය සමාජශීලී ය. ඔපාදුප බිනීමෙහි දක්ෂයෝ ය.***

මෙහි විශාල ගම් කීපයක් ඇත. සිංහලයින් කුඩා කණ්ඩායම් වශයෙන් ඒකරාශි වී සියළු කෘෂිකාර්මික වැඩ සාමුහිකව කරන බවක් පෙනී ගියද තම තමන්ගේ කුඩා ඉඩම් කැබැල්ලේ වෙන් වෙන්ව සෑදු පැල්පත්වල ජීවත් වෙති. බොහෝ පලාත්වල මිනිසුන් ඔවුන්ගේ කුඹුරු ආසන්නයේ, සුළං කපොලුවලින් බැහැර එළිමහනේ පැල්පත් තනා ගනිති. ගේ දොරකඩම ඔවුන්ට උවමනා සියළු දේ - සහල්, එදිනෙදා වැඩපලට අවශ්‍ය පිරිස්, ගව දෙනුන්ගේ සහ මී හරකුන්ගේ කිරි, පලතුරු, සහ තෙල් තිබේ. වරින් වර සංචාරක වෙළඳුන්ගෙන් බඩු හුවමාරු ක්‍රමයට සැප පහසුව සඳහා ලුණු ටිකක්, දුම්කොල, කරවල, වැඩ දැමූ ලේන්සුවක් වැනි යමක් ගනිති. කුඹුරුවල සියළු බර වැඩ කරන්නේ පිරිමින්ය. ගැහැණු, වල් නෙලීම, අස්වනු කැපීම, කිරි දෙවීම, නුල් කැටීම, සහ ගෙදර දොර වැඩපල බලා කියා ගැනීම කරති. පොහොසතුන් වැඩි කාලයක් මිඩංගු කරන්නේ එකිනෙකා මුණ ගැසී අසල් වැසියන්ගේ තොරතුරු කතා බහ කිරීමටත්, කතා හෝ සංගීතයට සවන් දීමටත්, පෘතුගීසීන් විසින් ඔවුන්ට උගන්වන ලද කාඩ් ක්‍රීඩා වල යෙදීමටත්ය. ගැහැණුන් වඩාත් කැමති දාම් ඇදීමටය.

ස්වදේශිකයෙකුගේ පැල්පතක ඇතුලේ දැක ගැනීමට වැඩි මනත් යමක් නැත. කවිච්චියක් දෙකක්, කනප්පු සහ පැදුරු කීපයක්, පිඟන් දෙක තුනක්, වට්ටි සහ කළගෙඩි කිහිපයක්, ලී වංගෙඩියක් සහ මෝල් ගහක් ආදී බඩු ස්වල්පයකි. මුල්ලක කුරක්කන් සහ අනෙකුත් කුඩා ධාන්‍ය ඇඹරීමට ගන්නා ගල් යුගයේ ඇඹරුම් ගලක් වැනි ගල් අත් වංගෙඩියකි. හිරමනයක් ඇතුලත් කිරීමෙන් බඩු ලැයිස්තුව සම්පූර්ණ වේ. එය,

වෑංජන සඳහා පොල් හීනියට කැබලි කර ගැනීමට ලී බංකුවකට සවි කල යකඩයෙන් කල දැති පීරකි. හිරු උදාවත් සමග අවදි වන ඔවුහු රාත්‍රි 9ට පමණ ගිනි මැලයක් අසල එලූ පැදුරක නින්දට යති. දවල්ට ඔවුන්ගේ ප්‍රධාන ආහාරය වන බතකින් හා වෑංජනයකින් සප්පායම් වෙති. යමක් කමක් ඇති අය එයට බිත්තර, කුකුල් මස්, දඩ මස් වැනි දෙයක්ද එකතු කර ගනිති. නින්දට යාමට පැයකට පෙර ගන්නා රාත්‍රී ආහාරය බොහෝ විට මුදවාපු කිරි සමග මොනවා හරි යමකි. ඔවුන් කිසි දිනක කේජු කැබැල්ලක රස බලා නැත. බටර් ද විශේෂිත ආකාරයකට සකස් කර ගිතෙල් යනුවෙන් හඳුන්වති.

ගැහැණු ළමයි අනිවාර්යයෙන්ම ඉතා ලාබාල අවදියේදීම විවාහ වෙති. වයස්ගත ගෘහ සේවිකාවන්ද විරලය.

සංචාරකයා දුටු නගර පිළිබඳ විස්තරයක් ලබන කලාපයෙන්

29 පිටෙන්

පැවති කේවල තරගයේ අවසන් වටයේදී ලකුණු 12 - 10 ක් ලෙස දීපිකා පරාජයට පත්වූ බැවිනි.
එම තරගයේදී දෙදෙනාම වට දෙක බැගින් ජයගෙන තිබූ අතර අවසන් වටයේදී වරක් දීපිකා පෙරමුණ ගෙන ජයග්‍රහණය ආසන්නයේද රැඳී සිටියාය.
එම ඉසව්වට අයත් දීපිකා රොඩ්රිගු හා ඉන්දියාවේ පව්ලම් ගටක් අතර පැවති තරගයත් දීපිකාද ඉෂාරා මධුරංගි හා ඉන්දියාවේ නන්දිතා ෂා අතර පැවති තරගයෙන් ඉෂාරාද ජය අත්කර ගෙන තිබූ බැවින් එකී අවසන් තරගයේ ජය දීපිකාට හිමි වී නම් ශ්‍රී ලංකාවට පළමුවන මේසපන්දු රන් පදක්කමට උරුමකම් කීමේ අවස්ථාව ලබා ගත හැකිව තිබිණි.
මෙම තරගාවලියෙන් පසු ඉන්දීය කණ්ඩායමේ කළමණාකරු කේ. බාවා මහතා ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා පිලේ දීපිකා රොඩ්රිගු, ඉෂාරා මධුරංගී හා තිළිණ පියදාස යන ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිළිබඳ තමන් පුදුමයට පත්වූ බවය.
කෙසේ වුවත් 1993 වසරේ ශ්‍රී ලංකා කාන්තා මේසපන්දු කණ්ඩායම පළමුවන රිදී පදක්කම දිනාගත් අවස්ථාවේ ඊටද වැඩි දායකත්වයක් සපයා තිබුනේ දිපිකා රොඩ්රිගු විසිනි.
දීපිකාගේ අතීත දස්කම් පිළිබඳ තමන්ට එතරම් මතකයක් නැති බව පවසා තිබූ මවුමා දාස් මෙවර තරගාවලිය මුලදීම ඇය තමන්ට අභියෝගයක් වන බව දැනුන නිසා මුල සිටම ඇගේ දුර්වල තැන් අධ්‍යයනය කරමින් තරග වැදුනු බව මවුමා දාස් සඳහන් කර තිබුණි.
දකුණු ආසියානු ක්‍රීඩා උළෙලකට පළමු වරට මේසපන්දු ක්‍රීඩාව එක්ව ඇත්තේ 1989 වසරේ ඉස්ලාමාබාද් නගරයේ පැවති තරගාවලියේදී ය. එතැන් සිට මේ දක්වාම එම ක්‍රීඩා උළෙල ඉතිහාසයට ඉන්දිය ක්‍රීඩක ක්‍රීඩිකාවන් හැරුණු විට රන් පදක්කම් දිනන්නට වාසනාවන්ත වී ඇත්තේ නේපාලය හා පාකිස්තානය පමණි.
පාකිස්තානය 1989 වසරේ රන් පදක්කම් දෙකක්ද 1991 වසරේ එක් රන් පදක්කමක්ද දිනා ගත් අතර එතැන් සිට ඔවුන් අතින් අවම වශයෙන් රිදී පදක්කමක් හෝ දිනා ගැනීම වැරදී ගොස් නොතිබිණි.
එසේ වුවද 10 වැනි දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී පළමුවරට ඔවුන්ට සම්පූර්ණයෙන්ම ලෝකඩ පදක්කම් වලින් සෑහීමට පත්වන්නට සිදුවිණි.
එම තත්ත්වය ශ්‍රී ලංකා කණ්ඩායමේ පිබිදිම නිසා සිදුවූවක් ලෙස සැලකිය හැකිය. දීපිකා රොඩ්රිගු, ඉෂාරා මධුරංගී හා තිළිණ පියදාස ගෙන් මෙවර ඉන්දීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අභියෝග එල්ල වී තිබුණි.
විශේෂයෙන්ම මේ වනවිට දීපිකා රොඩ්රිගු ඇගේ උපරිමයට ළඟා වී ඇති බව පැහැදිලිය. එහෙත් ඇය දැන් 28 හැවිරිදි වියේ පසුවන බැවින් තම රට වෙනුවෙන් යමක් කරන්නට ඇයට ඉතිරිව ඇත්තේ තවත් කෙටි කාලයක් බවටද විවාදයක් නැත.
කුමන ක්‍රීඩාවක වුවද දිනෙන් දින තත්ත්වය ඉහළ නැංවීමට නම් ඒ ඒ ක්‍රීඩාවේ රැඳී සිටින සුපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමුගන්නා විට ඔවුන් පසුපස පියවර තබන පිරිසක් සිටිය යුතුමය.
ඒ අනුව බලන කල නම් ශ්‍රී ලංකා මේසපන්දු ක්‍රීඩාවේ කාන්තා අංශය වාසනාවන්තය.
මතු දිනක දීපිකා රොඩ්රිගු ගෙන් හිස්වන ස්ථානය හිමි කර ගන්නටත් එතැන් සිට ඉදිරියට දිගු පියවර තබන්ටත් තමන්ට හැකියාව ඇති බව සනාථ කරන්නට 16 හැවිරිදි වියේ පසුවන ඉෂාරා මධුරංගි හා 19 හැවිරිදි කල්පනී හේරත් සමත්ව සිටින්නීය.

We are a happily married professional Sri Lankan couple who would dearly love to have children. We have been trying to conceive for a member of years and the doctors have advised us that the only way to make our dream come true is with the help of a compassionate and generous egg donor. If you are under the age of 35 who have completed your family and would consider helping us to make our dream a reality, please write to "Helping our Women" Sannasa, No.22, Lorne Sr. Lalor, Vic 3075 or email help1woman@yahoo.com.au. All travel and medical expenses will be reimbursed.

This advertisement has been approved by the Victorian Minister of Health, as required by s.40 of the Human Tissue Act 1982 (Vic) (October 2006)